**බේරුවල නගරසභාව - 2022**
**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බේරුවල නගරසභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බේරුවල නගරසභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සභා අරමුදලින් ඉදි කරන ලද එකතුව රු.5,666,640 ක් වූ ව්‍යාපෘති 05 ක් වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | සියළුවත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ජර්නල් සටහන් 39 මගින් රු.19,201,200 ක් ලැබිය යුතු මස් කඩ කුලී ගිණුමට හර කර තිබුණ ද ලෙජර ගිණුමේ රු.13,964,570 ක් ලෙස එනම් රු.5,236,630 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ජර්නල් සටහන් 65 මගින් රු.2,619,100 ක් වූ ලැබිය යුතු මස්කඩ කුලී , ටෙන්ඩර් තැන්පතු වලින් හිලව් කර තිබුණද එය ලෙජර ගිණුම්වල ගලපා නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | 2022 දෙසැම්බර් 31 දිනට රු.133,316 ක් වූ ආයුර්වේද ගබඩා බඩු තොගය ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඉ) | සේවකයින් 27 දෙනෙකුගෙන් වැටුප් රහිත නිවාඩු ලෙස දින 122 ½ ක් සඳහා ලැබිය යුතු රු.141,510 ක මුදල ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.2,190,160 වෙනසක් විය. | 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගිණුම් විෂයයන් 03 ක ශේෂ පිරික්සුමේ ශේෂයන් හා ලෙජර් ගිණුම් ශේෂයන් අතර රු.1,171,700 වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 අවිනිශ්චිත ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ නිරවුල් නොකල බැර ශේෂය රු.205,995 ක් විය. | මෙම අවිනිශ්චිත ගිණුමේ ශේෂය 2023 වර්ෂයේදී නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ජර්නල් සටහන් 21 මගින් පෙර කාල පරිච්ඡේදවලට අදාලව ගෙවා තිබූ රු.190,083 ක වැටුප් 2021 වර්ෂයේ වියදමක් ලෙස හා ණයහිමි යටතේ සටහන් වීමේ වරද නිවැරදි කිරිමට ණයහිමි ගිණුම හර කරනු වෙනුවට අවිනිශ්චිත ගිණුම හර කර තිබුණි. | ඉදිරියේදී ජර්නල් සටහන් මගින් නිවැරදි කිරිමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2019 දෙසැම්බර් 24 දිනැති අංක 2155/8 දරන ගැසට් පත්‍රයේ රීති අංක 325 | පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු දේපල බදු දීම හෝ කුලියට දීමේ ටෙන්ඩර් කමිටුව සඳහා පත් කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා දේපල බදුදීම හෝ කුලියට දීමේ ටෙන්ඩර් කමිටුව සඳහා පත් කර ඇති බව. | පළාත් පාලන රීති සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.12,368,388 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.50,168,141 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,208,192 | 15,208,192 | 16,305,655 | 16,305,655 | 15,219,000 | 15,219,000 | 15,804,162 | 18,471,762 |
| (ii) | කුලී | 26,009,270 | 26,009,270 | 26,537,046 | 1,140,784 | 18,548,000 | 23,067,504 | 21,741,322 | 6,767,674 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 200,000 | 200,000 | 106,000 | 137,000 | 200,000 | 1,820,000 | 1,628,600 | 191,400 |
| (iv) | වෙනත් ආදායම් | 2,233,200 | 2,233,200 | 2,824,824 | 966,971 | 1.895,000 | 275,000 | 473,000 | (195,700) |
| | | 43,650,662 | 43,650,662 | 45,773,525 | 18,550,410 | 35,862,000 | 40,381,504 | 39,647,084 | 25,235,136 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු කාල විශ්ලේෂණයට අනුව වර්ෂයකට අඩු හිඟය රු.840,552 ක්ද, වර්ෂ 01-03 අතර හිඟය රු.3,884,769 ක්ද, වර්ෂ 03-05 අතර හිඟය රු.3,012,967 ක්ද, වර්ෂ 05-10 අතර හිඟය රු.6,393,709 හා වර්ෂ 10 යට වැඩි හිඟය රු.2,081,672 ක් ද විය. | වරිපනම් බදු මුදලින් කොටසක් අයකර ගෙන ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු රු.43,000 ක් වූ අතර වර්ෂය තුල කිසිඳු මුදලක් අයකර ගෙන නොතිබුණි. | 2022.10.22 මාසික සභාවෙන් කපා හැරීමට තීරණය කළ බව. | කපා හැරීම් සඳහා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පැවරී ඇති කටයුතු

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගෝ ඝාතක ආඥා පනතේ 11 සහ 12 වගන්ති ප්‍රකාරව ඝාතනයට නියමිත සතුන් ඝාතනයට පැය 24 කට පෙර පරික්ෂා කිරිම සඳහා මහජන සෞඛ්‍ය පරික්ෂක වෙත ඉදිරිපත් කර නොතිබු අතර ගව මස් ප්‍රවාහනයද මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ අධික්ෂණයකින් තොරව සිදු වී තිබුණි. | පිළිතුරු ලබා දී නැත. | ගෝ ඝාතක පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | පොදු වෙළඳපොල එළ හරක් මස් කඩයේ මස් වෙළඳාම් කිරිම සඳහා ටෙන්ඩරය ලබා ගන්නා පුද්ගලයාට සභා බල ප්‍රදේශයේ වෙනත් ස්ථාන 09 ක් තුළ එළ ගව මස් විකිණිම සඳහා ද බලපත්‍ර ලබාදී තිබුණි. එහෙත් ටෙන්ඩරය ලබාගත් පොදු වෙළඳ පොල එළ හරක් මස්කඩය වසා තිබු අතර කුලී මුදල්ද නිසි පරිදි ගෙවීම් කර නොතිබුණි. | මේ වන විට ටෙන්ඩර් ලබාගත් පොදු වෙළඳ පොල එළ හරක් මස්කඩය වසා නොතබා දිගටම වෙළඳාම සඳහා විවෘත කිරිමට කටයුතු යොදන බව. | සභාවට ලැබිය යුතු ආදායම් මාර්ග ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බේරුවල, මරදාන පිහිටි කාය වර්ධන මධ්‍යස්ථානය සඳහා කායවර්ධන උපකරණ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂය තුල රු.382,900 ක් වැය කර තිබුණු අතර 2020 වර්ෂය තුලදී පරිත්‍යාග ලෙස ලද උපකරණවල වටිනාකම රු.692,510 ක් විය. කාය වර්ධන පුහුණුකරුවෙකු නොමැතිවීම හේතුවෙන් කාය වර්ධන උපකරණ හා ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවති අතර කාය වර්ධන උපකරණ | මෙම උපකරණ සුදුසු ස්ථානයකට ගෙන ගොස් කායවර්ධන මධ්‍යස්ථාන ස්ථාපිත කිරිමට කටයුතු කරන බව. | කායවර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සෘජුවම මුහුදු සුළංවලට නිරාවරණය වීම හේතුවෙන් මළ බැඳීමකට ලක්වීමේ අවධානමක් ද පවතුණි. | | |
| (ආ) 2016 වර්ෂයේ සිට සංවර්ධනය කිරිමට යෝජිතව තිබෙන නගර සභාවට අයත් බේරුවල පොල්කොටුව දෙමහල් ගොඩනැගිල්ල විගණිත දින වන විටත් කිසිදු සංවර්ධනයක් හෝ අළුත්වැඩියාවක් සිදු කර නොතිබුණි. තවද සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සායන කටයුතු සඳහා ගොඩනැගිල්ලේ පහල මාලය සතියකට එක් දිනයක් පමණක් යොදවාගෙන තිබුණද ඉහල මාලය නිශ්කාර්යව පැවතුණි. | මෙම ඉඩම සම්බන්ධයෙන් දිසා අධිකරණයේ නඩුවක් පවතින බැවින් සංවර්ධන කටයුතු කළ නොහැකි බව. | නීතිමය කටයුතු කඩිනමින් කරවා ගැනීමට උත්සාහ කළ යුතු අතර සභාව සතු සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ඇ) සභාවට පරිත්‍යාග ලෙස ලැබුණු බණ්ඩාරවත්ත සුසාන භූමිය, පොදු වැසිකිළිය , මස්සල්ගොඩ නිවාස යෝජනා ක්‍රමයේ පොදු ළිඳ හා පිටවල සුසාන භූමිය යන වත්කම් සහ ට්‍රැක්ටර් ටේලර් 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | පරික්ෂා කොට 2023 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව. | සභාවේ වත්කම් ලේඛනගත කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාර්ග නම් කිරිමේ නාම පුවරු 62 ක් සකසා සවි කිරීමේ ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණු අතර ඒ සඳහා සිමෙන්ති මිටි 114 ක් භාවිත කළ බවට බිල්පත් ඉදිරිපත් කර තිබුණි. එසේම කොන්ක්‍රිට් කියුබ් 3.87 ක් සකස් කිරිමට නුපුහුණු, අර්ධ පුහුණු හා පුහුණු ශ්‍රමිකයින් යොදාගත යුතු වුවද, පුහුණු ශ්‍රමික දින 70 ක් යොදාගෙන රු.230,750 ක් ගෙවා තිබුණි. | සියළු ද්‍රව්‍ය සඳහා ගබඩාවෙන් නිකුත් කිරිම් නියෝග නිකුත් කර ඇති බව. | සෘජු ශ්‍රමය යටතේ කර්මාන්ත සිදු කිරීමේදී ද්‍රව්‍ය විශ්ලේෂණ සහ ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ එකතු කිරිමේදී දිරන කසළ හා නොදිරන කසළ වෙන් කර ලබා ගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබීම හේතුවෙන් පර්චස් 100 කින් යුත් හලවල වෙත්තිමරාජපුර කසළ වත්තට දිරන කසළ මෙන්ම පොලිතින් වැනි නොදිරන කසළද බැහැර කර තිබුණි. එමෙන්ම මහජනතාව විසින්ද පෞද්ගලිකව නොදිරන කසළ එම ඉඩමට බැහැර කරන බවත් එම ඉඩමට පරිභාහිරව වෙනත් ස්ථානවලද කසළ බැහැර කර තිබු බවත් නිරික්ෂණය වු අතර එයට එරෙහිව සභාව විසින් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | මේ වන විට කසළ දිරන හා නොදිරන ලෙස වෙන් කර ලබා ගන්නා බව. | කසළ සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් නොතිබුණි. |